# ප්‍රජා, අයිතීන්, ස්ත්‍රී - පුරුෂ සමාජභාවය සඳහා තාක්ෂණික සහාය (CRG TA)

# නිතර අසනු ලබන ප්‍රශ්න




ප්‍රජා සහභාගීත්වය, මානව අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි ඇති වන බලපෑම් අවමකිරීම තහවුරු කිරීම සඳහා 2021 ජනවාරි මස සිට 2023 දෙසැම්බර් මස තෙක් ගෝලීය අරමුදලේ මුදල් ප්‍රධානයන් මගින් ක්‍රියාත්මකවන වැඩසටහන් භාවිතා කිරීමට සිවිල් සමාජ, ප්‍රජා සංවිධාන සහ ජාලයන්ට අවශ්‍ය තාක්ෂනික සහයෝගය ලබා දීම මෙහි අරමුණයි.

## CRG TA සඳහා අයදුම් කල හැක්කේ කාටද?

- HIV ක්ෂය රෝගය, සහ මැලේරියාව සඳහා අධි අවධානම් ප්‍රජාවන්ගේ ජාල හා සංවිධාන
- තරුණ නායකත්වයෙන් යුත් ජාල හා සංවිධාන
- කාන්තා ජාල හා සංවිධාන
- HIV, ක්ෂය රෝගය හා මැලේරියාව සමග ජීවත් වන පුද්ගලයන්ගේ ජාල හා සංවිධාන
- HIV, ක්ෂය රෝගය සහ මැ,ේරියාව සමග ජීවත් වන පුද්ගලයන්ගේ ජාල සහ සංවිධාන
- වෙනත් බලපෑමකට ලක්වු ප්‍රරජාවන් විසින් මෙහෙයවනු ලබන හෝ එම ප්‍රජාවන්ට සේවය කරන සිවිල් සමාජ ජාල හෝ සංවිධාන (උදාහරණ - සංක්‍රමණික, සරණාගත හා කම්කරු ප්‍රජාවන්
- දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණ (CCM), කලාපීය සම්බන්ධිකරණ යාන්ත්‍රණ (RCM) (මෙම යාන්ත්‍රන ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අයදුම්පත් ඉහත සඳ හන් ප්‍රජාවන් සමග ඒකාබද්ධව ඉදිරිපත් කල යුතුය)

## ඉල්ලුම් කල හැක්කේ කවදා ද?

2020-2021 සඳහා වන අරමුදල් චක්‍රයේ ඕනෑම අවස්තාවක අයදුම් පතක් ඉදිරිපත් කල හැක. ව්‍යපෘති ක්‍රියාත්මක වන කාලය සහ වැඩ සටහන් සමාලෝචනය කිරීමේ කාලය ද මීට ඇතුලත්වේ. තිරසාරභාවය හා ගෝලිය අරමුදලේ ආධාර වලින් ඉවත් වීමේ සැලසුම් (STC) සහ ජාතික ක්‍රමෝපායික සැලැස්ම සංවර්ධනය වැනි වෙනත් ගෝලීය අරමුදලේ ක්‍රියාකාරකම්, ප්‍රජා සහභාගීත්වය සඳහා ද මෙම වැඩසටහන මගින් සහාය දෙනු ලැබේ.

## කුමන ආකාරයේ තාක්ෂණික සහායන් මට ඉල්ලුම් කල හැකිද?

- තත්ව විශ්ලේෂණය හා අවශ්‍යතා තක්සේරු කිරීම
- දේශිය සංවාද ක්‍රියාවලියෙහි නිරත වීම
- ක්‍රියාකාරකම් නිර්මාණ කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම

දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණ ශක්තිමත් කිරීමට, සිවිල් සමාජ සංවිධානයන්හි දිගු කාලීන ධාරිතා සංවර්ධනයට, ප්‍රජා සහභාගිත්වය සඳහා අඩු අවධානයක් යොමු කරන මෙවලම් සංවර්ධනය කිරීමට සහ අරමුදල් ඉල්ලුම් පත් සකස් කිරීම (Funding Request Writing) සඳහා CRG TA වැඩසටහන සහාය නොදක්වයි.

## තාක්ෂණික සහාය සපයන්නේ කවුරුන් ද?

ගෝලීය අරමුදලේ  ප්‍රජා, අයිතීන්,  ස්ත්‍රී පුරුෂ සමාජභාවය සඳහා වූ දෙපාරතමේන්තුව මගින් පූර්ව අනුමැතිය ලබා දී ඇති  තාක්ෂණික සහාය ලබා දෙන්නන්  26 දෙනෙකු විසින් මෙම තාක්ෂණික සහාය ලබා දේ. සියලුම තාක්ෂණික සහකාර සැපයුම්කරුවන්  ආසියා පැසිෆික්  කලාපයේ  සංවිධාන නොවන අතර, හැකි සෑම අවස්තාවකදීම (සුදුසු නම් පමණක්) ආසියා පැසිෆික් සැපයුම්කරුවෙකු යොමු කරයි. ආසියා පැසිෆික් කලාපයේ තාක්ෂණ සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවෙන් ඔබගේ අයදුම්පතේ නිශ්චිත  සැපයුම්කරුවෙකු ඉල්ලා සිටිය හැකි මුත්, ඒ සඳහා අවසාන තීරණය ගනු ලබන්නේ CRG දෙපාරතමේන්තුව මගින්.

### පෙර අනුමත කරන ලද තාක්ෂණික සහායකවරුන්ගේ ලැයිස්තුව

- AIDS & Rights Alliance for Southern Africa (ARASA)
- AIDS Strategy, Advocacy and Policy (ASAP)
- Alliance Consultancy*
- APCOM Foundation*
- Asia Pacific Network of People Living with HIV (APN+)*
- Center for Health Policies and Studies
- Coact*
- Coalition PLUS
- Eurasian Coalition on Health, Rights, Gender and Sexual Diversity (ECOM)
- Frontline AIDS*
- HIV, Accelerated, Real-time, Versatile, Equitable, Safe response, and TB response - Technical Advisory (HARVEST-TA) consortium
- HIV Legal Network
- Hivos
- Harm Reduction International*
- International Community of Women Living with HIV Eastern Africa (ICWEA)
- Initiatives Conseil International-Santé (ICI SANTE)
- International Council of AIDS Service Organisations (ICASO)*
- Kenya NGO Alliance Against Malaria (KeNAAM)*
- Moldovan Institute for Human Rights (IDOM)
- Mainline Foundation*
- Community-led Assistance for Peer Engagement (CAPE)*
- PATA, Y+ Global and UNYPA
- PATH*
- Partners in Health
- Resource Group for Education and Advocacy for Community Health (REACH)*
- Stitching TB Europe Foundation Coalition

*អ្នកផ្តល់ជំនួយបច្ចេកទេសសម្រាប់តំបន់អាស៊ី និងប៉ាស៊ីហ្វិក

## අයදුම්කරන්නේ කෙසේද ?

අයදුම් කිරීම සඳහා ඔබ විසින් https://apcaso.org/apcrg/support/ වෙත පිවිස අයදුම්පත්‍රය බාගත කල යුතුය. වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා jeffacaba@apacaso.org  ඊමේල් ලිපිනය හරහා APCRG සංවිධානයෙහි ජෙෆ් අකබා මහතා සමගි සම්බන්ධ වන්න. අපි සතුටින් ඔබ වෙත සහයෝගය දැක්වීමට බැඳී සිටින්නෙමු. අයදුම්පත්‍රය පිරවීමෙන් පසු එය crgta@theglobalfund.org වෙත ඍජුව යොමු කරන්න.

CARE සාමූහිකය යනුවෙන් හැඳින්වෙන්නේ විවිධත්ව සඳහා වූ සහයෝගීතා පදනම (DAST), ශ්‍රී ලංකා ජාතික සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ගේ ජාලය (NTNSL) හා යංග් අවුට් හියර් ශ්‍රී ලංකා භාරය (YOH) යන සංවිධානයන් ගේ එකමුතුවෙන් පිහිටුවාගත් තාක්ෂණික සහාය සැපයුම් ඒකකයකි. මෙම සාමූහිකය පිහිටුවා ගැනීමේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ අධි අවදානම් කණ්ඩායම් සහ එච්අයිවී ප්‍රතිචාරය තුළ අවදානමක් දක්වන ප්‍රජාවන් සමඟ කටයුතු කරනු ලබන සිවිල් සමාජ හා පුද්ගල කොට්ඨාශයන්ගේ ධාරිතා ගොඩනැංවීමත්, ප්‍රජා බලමුලු ගැන්වීමත්, හා ඔවුන්ගේ අධිවාචන ක්‍රියාදාමයන් ට අවශ්‍ය තාක්ෂණික සහාය සැපයීමත් ය. එමගින් ජාතික එච්අයිවී ප්‍රතිචාරයට අදාළ සැලසුම්, එවා ක්‍රියාවට නැංවීම් සහ අධීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් තීන්දු තීරණ ගනු ලබන වේදිකා තුළ මෙම පුද්ගල කොට්ඨාශයන් ගේ ඵලදායී සහභාගීත්වය ශක්තිමත් කිරීමයි.

APACASO යනු සෞඛ්‍ය, සමාජ යුක්තිය හා මානව හිමිකම් සම්බනධයෙන් වු ආසියා පැසිෆික් සිවිල් සංවිධානයකි.  ආසියා පැසිෆික් කලාපීය ප්‍රජා, අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය (CRG) සමුහයේ වත්මන් සත්කාරකයා APCASO සංවිධානයයි. ගෝලිය අරමුදලේ ව්‍යාපෘති තුල  HIV, ක්ෂය රෝගය සහ මැලේරියාව සම්බන්ධයෙන් පවතින ප්‍රජා, අයිතීන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාව වටිනාකම් ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය  කාලීන හා අදාල තොරතුරු සැපයීම APCRG හි අරමුණයි.

www.apcaso.org/apcrg/    APCASO